# නාච්චාදූව වැව ආශ්‍රිතව සිදුව ඇති අතීත වර්තමාන තාක්ෂණික වෙනස්කම් හා ඒවා අද දක්වා පැවත එන ආකාරය පිළිබඳව අධ්‍යයනයක්

ජේ.ජේ.එච්. කිරිමැටියාව[1]

මුඛ්‍ය පදඃ වැව, වාරි තාක්ෂණය, නාච්චාදූව වැව

## හැඳින්වීම

ජලය රැස්කර තබා ගනිමින් අවශ්‍ය වූ විටදී කර්මාන්තයන් සඳහා සහ විවිධ අවශ්‍යතාවයන් උදෙසා එම රැස් කරගත් ජලය යළි නිකුත් කළ හැකි මානව නිර්මිතයක් ලෙසින් වැව හඳුන්වා දිය හැකිය (විතානාච්චි, 2017:52). ජනගහනයේ වර්ධනයත් සමඟ ම නාගරීකරණය සහ වාණිජ කටයුතු දියුණු වීම වැනි සාමාජීය හේතුන් මත ග්‍රාමීය වැව් පද්ධතිය අඩපණ වීම හේතුවෙන් එයට ඔරොත්තු දීම සඳහා වඩාත් පුළුල් වැව් තැනීම ආරම්භ වී ඇත (විතානාච්චි, 2004:67,68). මෙවැනි වැව් හුදකලා වැවක් ලෙස කලාතුරකින් හමුවුව ද පොදුවේ ගත් කල බොහෝ මහා වැව් කුඩා ගම්වැව් කිහිපයක් හෝ වැව් පද්ධතියක් සේ එකිනෙකට බැඳී පවතී.

මෙලෙස එකිනෙකට බැඳී සම්බන්ධවන පරිදි පෝෂණ රටාවකින් යුතු වැව් සමූහයක් හෙවත් වැව් පද්ධතියක් ඇඳතු වැව් හා ජාලගත වැව් ලෙස ද හඳුන්වා දිය හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ නාච්චාදූව වැව ආශ්‍රිත ව අතීතයේ පටන් වර්තමානය දක්වා කාලය තුළදී සිදුව පවතින තාක්ෂණික වෙනස්කම් කොපමණද එය සිදුවූයේ කෙසේද යන්න විමසීමයි. එමෙන්ම නාච්චාදූව වැවෙහි තාක්ෂණය අතීතයේ පටන් වර්තමානය දක්වා පැවත එන ආකාරය අධ්‍යයනය කිරීමද මූලික අරමුණු කර ගනිමින් පර්යේෂණය සිදුකරන ලදී.

## ක්‍රමවේදය

අධ්‍යයනයේදී අරමුණු සාධනයට අදාළ තොරතුරු එක් රැස්කොට ගැනීමේ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර ගවේෂණයේ සහ සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු ලබා ගන්නා ලදී. මෙම අධ්‍යයනයට සම්බන්ධව පවතින සාහිත්‍ය මූලාශ්‍ර ඉතා අල්ප වුවද මීට පෙර සමස්ත ග්‍රාමීය වැව් පද්ධතිය අල්ලා ලියවී ඇති සාහිත්‍යමය මූලාශ්‍රයන් අධ්‍යයනය මගින්ද යම් අවබෝධයක් ලබා ගැනීම සිදුකොට ඇත.

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
jayalankajayawardhana1999@gmail.com

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

උතුරු මැද පළාතේ නාච්චාදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාච්චාදුව තුලානේ නාච්චාදුව වැව පිහිටා ඇත. මෙම වාරි නිර්මිතය කුඩා වැව් කිහිපයකින් යුතු වැව් පද්ධතියක ජලධාරිතාව දරා සිටින ප්‍රධාන මහ වැව වේ. කෘෂිකර්මාන්තයේ ප්‍රධාන කොටගෙන විවිධ අවශ්‍යතාවයන් උදෙසා ජලය ගබඩා කර ගැනීමේ පරමාර්ථයෙන් නිර්මාණය වී ඇති නාච්චාදුව වැවෙහි ප්‍රධාන ජල සම්පාදන ක්‍රමවේදය ලෙස වර්ෂාවෙන්, ඇලමාර්ග මගින් ජලය ලබා ගැනීම අනුව ද, එමෙන් ම රිටිගල කඳු පාමුල ආශ්‍රිතව ඇදීයන දිය දහරා හෙවත් මල්වතු ඔය හරස් කර ගනිමින්ද ජලය ලබා ගැනීම සිදුව ඇත.එමෙන්ම කලා වැව මගින් මහවැලි ඇල හරහා නාච්චාදූවට ජලය ලබා ගෙන ඇති අතර මල්වතු ඔය හරස්කර වේළි බැද මෙම නාච්චාදුව වැව නිර්මාණය කර ඇත.එමෙන්ම මෙයට යටත්ව ඇති කුඩා වැව් සංඛ්‍යාව දහයකටත් අධික ප්‍රමාණයක් වන අතර, එහිදී කුසව, නීලප්පට්ටිය, පාඩියන්කුලම වැනි වැව්ද මෙයට අයත් වේ. එසේම වැවට ඉහළින් පිහිටි මානක්කට්ටිය, ඊරු වැව යන වැව් වලින් ද අමතර ජලය පිටවන කාලවලදී මෙම නාච්චාදුව වැවට ජලය ලැබෙණු ඇත.

එසේම මාවතවැව, කැලේගම, කරුවලගස් වැව, පුලියන්කුලම, මහාවැව, ගුලුපත්වැව, කුසව යන වැව් වලින්ද ජාලානුගතව මෙම ප්‍රධාන වැව සඳහා ජලය ලැබෙන මාර්ගයන් වේ. මෙම නාච්චාදුව වැව ආශ්‍රිතව තාක්ෂණික අංග හා ක්‍රමවේදයන් පිළිබඳව විමසා බැලීමේදී වැවට ලැබෙන ජලයේ පීඩනය දරාගනු ලබන වැකන්දෙහි වර්තමාන දිග මීටර 1650 කි. පළල මීටර 2.74කි. සම්පූර්ණයෙන්ම අභාවයට පත්ව තිබූ නාච්චාදුව ව්‍යාපාරයට 1880 සිට මධ්‍යම වාරි මාර්ග මණ්ඩලයේ අවධානය යොමු විය. එහෙත් ඒ පිළිබඳව පූර්ණ මිනුම් කටයුතු අවසන් කර රජයේ ප්‍රතිපාදන වෙන් කිරීම සිදුවුණේ 1900 දී පමණය. ජලාශය හා වාරිමාර්ග පද්ධතිය ඉදිකිරීම 1904 දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ආරම්භ කර ඇති අතර, එය නිමකරන ලද්දේ 1914 දීය. අබලන් වූ වැව් බැම්ම හරහා හරහා කැඩුම් කඩ හතක් පමණ තිබූ අතර ඒවා පිරවීම නව පිටවානක් ඉදිකිරීම හා සොරොව් දෙකක් ඉදි කිරීම මේ ප්‍රතිස්ථාපනයේදී සිදු කළ කටයුතුය. වැව් බැම්මේ වම් කෙළවරෙහි ඉදිකළ සොරව්ව මගින් නාච්චාදුව ජලාශයෙන් ප්‍රතිලාභ ලබන පවුල් දෙදහස් පන්සියයකට පමණ ජීවිකාව සපයන අක්කර හත්දාහක පමණ ඉඩම් ප්‍රමාණයකට ජලය ලබාදීම සිදුවන අතරම, දකුණු කෙළවරෙහි පිටවාන සමගම ඇති සොරොව්ව තුළින් ජලාශයේ දකුණුපස පිහිටි කුඩා බැම්මක් ආශ්‍රිතව ඉදිකර ඇති ගේට්ටු දහයකින් සමන්විත සොරොව්වලින්ද නුවර වැවට ජලය ලබාදීම සිදුකරනු ලබයි. 1904-1914ඉදිකිරීම් සමය තුළ යන්ත්‍රෝපකරණ නොතිබුණු බැවින් බ්‍රිතාන්‍ය රජයේ ඉංජිනේරු රෙජිමේන්තුවේ මිනිස් ශ්‍රමය යොදාගත් බවද සඳහන් කරයි. එකල ඉදිකළ පුපුරන ද්‍රව්‍ය ගබඩාවක් ද නාච්චාදුව වාරිමාර්ග පරිශ්‍රය තුළ දැකිය හැකිය. වැව් තාවුල්ලේ පිහිටි කුඩා ගම්

වැව් කිහිපයක් ආශ්‍රිතව ගොවිතැන් කරමින් සිටි සිංහල හා මුස්ලිම් වැසියන් මෙම නව ව්‍යාපාරය යටතේ ඉඩම් ලබාදී පදිංචි කර ඇත. මෙම වැවෙහි පිහිටි දොරටු නවීන සහ පැරණි වශයෙන් නම් කර ඇත. පැරණි සොරොව්වල උස ප්‍රමාණය මුහුදු මට්ටම් 94.06msl වලින් ඉදිකර ඇත. වාරිමාර්ග බිම්කට්ටි සැලසුම් කිරීම පිළිගත් තාක්ෂණ ක්‍රමවේදයකට අනුව මුලින්ම සිදුකරන ලද්දේ මේ ව්‍යාපෘතිය යටතේදීය. තිසා වැව දක්වා ජලය ගෙන ගිය කලා වැව මගින් යෝධඇල මගින් අමතර ජලය 1969 වසරේදී ලබාදීම ජල හිඟයින් පීඩා විඳි නාච්චාදුව ගොවිජන පදිකයන්ට විශාල සහනයක් විය. මෙහි අක්කර අඩි හතළිස් හයදාහක් පමණ ජලය ගබඩා කළ හැකි වත්මන් ජලාශය අක්කර 4400 ක් පමණ බිම් ප්‍රමාණයකින් පුරා පැතිරී ඇත.

මෙහි ප්‍රතිලාභ ලබන ඉඩම් ප්‍රමාණය අක්කර හත්දහසක් පමණ වේ. එසේම ජලාශය ආශ්‍රිතව සිදුකරන මත්ස්‍ය කර්මාන්තයෙන්ද දිවිරැක ගන්නා පවුල් විශාල සංඛ්‍යාවක් ඇත. 1957 දී ඇති වූ මහා ගංවතුරේදී වැව් බැම්ම බිඳී ගිය අතර එයට හේතුව වූයේ ඉහත්තාවේ පිහිටි මානක්කට්ටිය හා ඒරු වැවහි එල්ලංගා පද්ධති කිහිපයක් බිඳී යෑම හේතුවෙන් ජල කඳ දරා ගැනීමට වැව් බැම්මට නොහැකි වූ නිසා බව දක්වා තිබේ. 1958 වසර අවසාන වන විට ජලාශය නැවත යථා තත්ත්වයට ගෙන ඒමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට හැකි විය. නාච්චාදුව වැව ආශ්‍රිතව දක්නට ලැබෙන අනෙකුත් තාක්ෂණික අංග අතර වැවට ජලය ලැබෙන ප්‍රදේශවල වැව් පිටියට වඩා විශාල ප්‍රදේශයක වැව් ඉහත්තාව පැතිරී එය ඈඳතු වැව් ආශ්‍රිතව විහිදෙයි. මෙම වැව සතුවවිශාල ප්‍රදේශයකවැව් පිටිය පැවත අති අතර වර්තමානය වනවිට එය ප්‍රමාණයෙන් කුඩා වී ඇත. එයට හේතුව ලෙසින් වැව් තාවුල්ල අතීතයේ පටන් මේ දක්වාම ගොඩ හේන් ක්‍රමයට හා ගොඩ කුඹුරු ක්‍රමයට වගා කර තිබීමයි. එමෙන්ම අතීතයේ සිට පැවත ආ කුබල් කර්මාන්තය හේතුවෙන් අවශ්‍ය කරන මැටි කපාගැනීම ද සිදුවෙමින් පවතී. එමෙන්ම උළු කර්මාන්තය සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය ද යොදා ගනු ලබයි. මෙම වැව ඉදිකිරීමේ දී මුල් කාලීනව කඩවලවල් 04ක් දැකගත හැකිව තිබී ඇති අතර එය මගින් අතීතයේ වැව පැවති බවට හඳුනාගත් බවත් කියැවේ .එමෙන්ම මෙම වැව ආශ්‍රිතව දූපත් 09ක් දැකගත හැකිය. වර්තමානයේ  දී ද දැකගත හැකි අතීත ජල පීඩනමාපකයක් ද ඇත. එය වර්තමානයේ දී හඳුන්වනු ලබන්නේ "බීරි සොරොව්ව" නමිනි. අමුණුකුලෙන් ජය ගඟ හරහා පෝෂිත ඇල ඔස්සේ නාච්චාදුව වැවට ජලය ලැබෙන අතරම එය **කුසව** නම් ප්‍රදේශයෙන් නාච්චාදුව වැව සඳහා ජලය නිකුත් කරනු ලබයි. ඒ ආශ්‍රිතව පවතින කොත්තනායම් කැලේ තුළින් පෞරාණික නටබුන්ද හඳුනාගෙන ඇත. ගම්මුන්ගේ අදහසක් අනුව එය අතීත රජ මාලිගාවක් විය හැකි බවටද මත පල කරනුලබයි. එමෙන්ම අතීත බිසෝ කොටුව , කළුගල් ඇතිරූ රළ පනාවක්ද දැක ගත හැකිය. පසුකාලීනව ඉදිකරනු ලැබූ **අඩියේ පාලම** නැමති වැව හරහා ගමන් කිරීමට පවතින පාලමක්ද දැක ගත හැකිය. එමෙන්ම ලංකාවේ වාරි පුරාණ තාක්ෂණය තරම් පුළුල් වූත් සංකීර්ණ වූත් ශිල්පීය ඥානයෙන් විශිෂ්ට වූ වාර්තාක්ෂණය දකුණු ආසියාවේ ප්‍රදේශයක

බිහිව ඇති බව පැහැදිලි කරුණකි. ඒ අතරින් තිරස් ජාලගත හෙවත් ඇඳතු වැව් පද්ධතිය මගින් පෝෂණය වන මහ වැව් ප්‍රධානතම වාරි නිර්මිත වන අතරම මෙම වාරි නිර්මිතයන් අතරින් නාච්චාදූව වැව ආශ්‍රිත තාක්ෂණය අනෙක් වැව් අතරින් ප්‍රධාන තැනක් හිමිකර ගනී. අතීතයේ පටන් වර්තමානය දක්වා විවිධ වෙනස්කම්වලට ලක්වී ඇති බවත් වැවහි ඇතැම් අංගයන් තුළට ආක්‍රමණික ශාකවල බලපෑම මත අභාවයට යෑමක් දක්නට ලැබෙන බවද මෙම අධ්‍යයනයේදී පැහැදිලිව දක්නට ලැබේ.

**සමාලෝචනය**

නාච්චාදූව වැව ආශ්‍රිතව අතීතයේ පටන් වර්තමානය දක්වා කාලය තුළ දී සිදුව පවතින තාක්ෂණික වෙනස්කම් සහා වැවෙහි තාක්ෂණය අතීතයේ පටන් වර්තමානය දක්වා පැවත එන ආකාරය පිලිබඳව අධ්‍යයනය කිරීමේදී , ඉතාමත් සුලු වෙනස්කම් වලට ලක්ව ඇති බවත්, අතීතයේ ම පිහිටි දැ වර්තමානයේ දී දැක ගැනීමට නොහැකි වුව ද වර්තමානයේ දී විටින් විට ප්‍රතිසංස්කරණයට ලක් වී ඇති අංගයන් දැක ගැනීමට හැකිව ඇති බවත් සදහන් කළ හැකි ය. එමෙන් ම අතීතයේ පැවති වැවට සම්බන්ධ සිරිත් විරිත් ආදිය පිලිබදව ද එසේම හදුනාගත හැකි අතරම එම ක්‍රම වර්තමානයේදී ද හදුනාගත හැකියාවක් ඇත.ඒ අනුව නාච්චාදූව වැව ආශ්‍රිතව අතීතයේ පටන් වර්තමානය දක්වා කාලය තුළ ඉතා කුඩා වෙනස්කම් රාශියක් හදුනාගනීමට හැකියාවක් ලැබෙනු ඇත

**ආශ්‍රිත මූලාශ්‍රය**

විතානාච්චි, සී.ආර්. (2017). ***පුරාණ ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**සම්මුඛ සාකච්ඡා**

එරංග, පී.ඩී. (2025). නාච්චාදූව වැව ආශ්‍රිතව වර්තමානය තත්වය. ජේ. ජේ. එච්. කිරිමැටියාව, 2025.07.22